මේ ගෙවෙමින් පවතින්නේ 80 දශකයේ මුල් කාර්තුවයි. යූඑන්පී ආණ්ඩුව විසින් පවත්වන්නට යෙදුන සංවර්ධන සහා ඡන්දයෙන් පසු ලද විවේකයෙන් අප මදක් ගිමන් හරිමින් සිටියෙමු. ඒ අපකීර්තිමත් ඡන්දයේදී ආණ්ඩුව උතුරේ හා දකුණේ හැසිරුණ ආකාරය පිළිබඳ ප්‍රබල විරෝධයක් රටේ තිබුණද රට ජේආර් ජයවර්ධනට අවශ්‍ය ලෙස හැඩ ගැසෙමින් ඉදිරියට යමින් තිබුණි. 70 දශකයේ අගභාගයේ මැද පෙරදිගට කාන්තාවන් යැවීමේ ව්‍යාපෘතියේ පටන් කඩිනම් මහවැලි ව්‍යාපාරය හරහා ලද රැකියා අවස්ථාද ඒ හා බැඳුණ කුඩා පරිමාණ ව්‍යාපාරකිරීමේ හැකියාව හරහා ද රටේ ජනතාව විවෘත ආර්ථිකයට මහත් සේ බැඳෙමින් තිබුණි. රූපවාහිණිය වීඩියෝ හා විදේශ ආයෝජන වලින් ලද නොයෙකුත් ඉඩ ප්‍රස්ථා නිසා අප ගොඩ නැගීමට ඉලක්ක කොට සිටි සමාජ පන්තිය අපෙන් දුරස් වෙමින් තිබුණි. පෙර නොලත් සුඛෝපභෝගී භාණ්ඩ පරිහරණය හරහා සමාජය එක්තරා සිහිනයක ගැලෙමින් සිටිනු පෙනුණි. එක අතකට එය අසාධාරණ ද නොවිනි. ඔවුනට ඇස්පනාපිටම කැමති දේ ලබා ගැනීමේ අවස්ථාවක් විවරවී තිබේ. අනෙක් පසින් අප නොපෙනෙන සමෘද්ධිමත් ලෝක රටාවක් ගැන - සමාජ ක්‍රමයක් ගැන - කියමින් එය ගොඩ නැගීමට ඔවුනට ආරාධනා කරමින් සිටිමු. ජනතාව හැම විටම තෝරාගන්නේ දෑස මානයේ පෙනෙන දේ ය. ස්වප්නය මායාවක් බව දැනුණද එහි සුන්දරත්වය ඔවුන් වශීකර ගනියි. අප සත්‍යය කතා කළෙමු. ඒ ඇත්ත බොහෝ දුර ය. ගමන දුෂ්කර ය. නිශ්චිත කාලයක් නැත . ඉතින් ඔවුන් අප කරා නොපැමිණීම පුදුමයක් ද? එහෙත්




# විප්ලවවාදියකුගේ සැබෑ කතාව

## අසමාන තරගයක අත්දැකීම

සැබෑ මිනිසකු කියන සත්‍ය කතාව
අසා ලියන්නේ
ජගත් ජේ එදිරිසිංහ

9

මෙකී කාරණා බොක්කටම කොක්ක වැදී ගොඩ නැගුණ අපට නම් අරුමයක් නොවේ. අප මුළු ඇඟ පුරාම කොකු මානා ගනිමින් කොකු ගසන්නට උත්සාහ දරන අතරේ ජේ ආර් විවෘත ආර්ථිකය නම් මහා දැළෙන් සමාජය බා ගනිමින් සිටියේය. සටන අසමාන මුත් අපි ද සටන අත්නොහැරියෙමු.

මේ වන විට ජේආර් ගේ ආණ්ඩුව 78 ජනාධිපති ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පසු වසර 4ක් ගෙවී තිබුණි. රටේ ප්‍රධාන විරුද්ධ පක්ෂය වූ ශ්‍රීලංනිප ය බොහෝ අඩපණ වී තිබුණි. එහි නායකත්වයට ප්‍රජා අයිතිය අහිමිව තිබුණ අතර අභ්‍යන්තර ගැටුම් නිසා එය සංවිධානාත්මකව බෙලහීන වී තිබුණි. කපටි පාලකයකු වූ ජේආර් තමන්ගේ ආර්ථික ක්‍රියාදාම තවදුරටක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණෙන් රටේ ප්‍රධාන වාමාංශික පක්ෂ වල ක්‍රියාකාරීත්වයෙන් ඉදිරියේදී ඇති විය හැකි තර්ජනය හා උතුරේ මතුවෙමින් තිබූ තත්වයද සැළකිල්ලට ගනිමින් කල් යල් බලා තමන්ගේ බලය තව දුරටත් තහවුරු කර ගැනීම සඳහා නියමිත කාලයට කලින් ජනාධිපතිවරණය පැවැත්වීමට තීරණය කලේය.

සියළුම පැති වලින් කොටු කරන ලද රටේ කම්කරු ජනතාව විරුද්ධ පක්ෂය ඇතුළු සියළුම වාමාංශික පක්ෂත් මේ ඒකාධිපති පාලකයාට එරෙහිව එක්සත් පෙරමුණක් ගොඩ නැගීමට තීරණය කරද ලදී . ඒ සඳහා සියළුම පක්ෂ වල සහභාගීත්වයෙන් 82 අගෝස්තු මස සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී රැස්වීමක් පැවැත්විණි. එහිදී තීරණය වූයේ සියළු දෙනාටම පිළිගත හැකි එක් පොදු අපේක්ෂකයෙක් ඉදිරිපත් කිරීමටය. එම අපේක්ෂකයා නිර්දේශපාලනික අපේක්ෂකයකු විය යුතු බවටද තීරණය විය. එසේ වුද ඉන්පසු ඇති වූ සාකච්ඡා දිගින් ඇදී ගොස් පොදු අපේක්ෂකයා යටපත්ව එක් එක් පක්ෂ වෙන වෙනම අපේක්ෂකයන් ඉදිරිපත් කරන තැනට පත්වුණේ ජේආර් ගේ අපේක්ෂා මුදුන්පත් කරමින්ය. මේ ක්‍රියාවලියේ යටින් සිටියේ ශූර කපටියකු වූ ජේආර් ම බව රහසක් නොවේ.

ජනාධිපතිවරණයේදී ජේආර්ට එරෙහිව කොබ්බෑකඩුව විජේවීර කොල්වින් ඇතුළු අපේක්ෂකයෝ කිපදෙනෙක් ඉදිරිපත්වූහ. ප්‍රතිඵලය ඇස් පනාපිටම තිබුණද සටන අතහැර පළා යාම කළ නොහැක්කකි. අපි විජේවීර සහෝදරයා දිනවන්නට නොව සැබෑ ලෙසට හොඳ තරගකරුවකු බවට පත් කරන්නට සටනට බැස්සෙමු.

මතුපිට කතාව එසේ වුවද ජනාධිපතිවරණයට රෝහණ විජේවීර සහෝදරයා ඉදිරිපත් වූයේ කැමැත්තකින් නොවන බව අපි දැන සිටියෙමු. බහුතරයේ කැමැත්ත මත මේ තීරණයට එන්නට විජේවීර සහෝදරයාට සිදුවූ බව මා සමග කීවේ අමරේ ය. මගේ මතකයේ හැටියට විජේවීර සහෝදරයාගේ නම යෝජනා කර තිබුණේ ලයියා ය.

එතැන් සිට අපි යළිත් මීමැසි ජීවිතය ඇරඹීමු. පක්ෂය සටන ඇරඹුවේ අති දැවැන්ත ප්‍රචාරක වැඩ පිළිවෙලක් හරහා ය. රට පුරාම රෝහණ සහෝදරයාගේ කටවුට් පෝස්ටර් බැනර් සව්විය. ගෙන් ගෙන ගොස් කරන කැන්වසින්ද සෑම නගරයකම ප්‍රධාන රැස්වීම්ද ගම්වල පොකට් රැස්වීම් ද තියමින් අප කළ ප්‍රචාරක ව්‍යාපාරය දෙවැනි වූයේ යූඑන්පීයට පමණකි. දිවයින පුරා පැවැත්වුණ මේ ප්‍රචාරක ව්‍යාපාරයට ජනතාවගෙන් ලැබුණ ප්‍රතිචාරය ඉමහත්ය. ඒ අතරින් විජේවීර සහෝදරයා සහභාගි වන රැස්වීම් වල ජන සහභාගීත්වය අති දැවැන්ත විය.

අප පක්ෂයේ වැඩ කටයුතු සඳහා කැට ව්‍යාපාර හරහා අරමුදල් එකතුකරන අතරේ විජේවීර සහෝදරයා එය කළේ අපූරු ආකාරයකටය. සෑම රැස්වීමකම ඔහු ජනතාව අමතන්නේ අවසානයටය. ඉත් උද්වේගකර කතාවක් පැය දෙකක් පමණ කරන ඔහු රැස්වීම අවසන් කොට සමාජවාදී සමාජය ගොඩනැගීමේ ප්‍රමුඛ පක්ෂය වන ජවිපෙ ගොඩ නැගීමට දායක වන ලෙස ඉතා හෘදයාංගමව ඉල්ලා වේදිකාව ඉදිරියට පැමිණ එරමිණියා ගොතාගෙන වාඩි වී ජනතාව දෙසට සිය දෝත දිගු කරයි. මේ අවස්ථාව ඉතාම සංවේදී අවස්ථාවක් විය. ඔහු ඉඳගත් සැණින් පැමිණ සිටින ජනතාව ඔහුට ආධාර කරනු පිණිස පැමිණෙන්නේ වැල නොකැඩී ය.

මේ ආධාර අතර මුදල් ඔරලෝසු රන් ආභරණ ආදියද තිබුණ බව මට මතකය. සෑම රැස්වීමක්ම අවසානයේ මේ ක්‍රියාවලිය සිදුවිය. ජනතාවගේ මේ පරිත්‍යාග තරුණ අපට මහත් ආශ්වාදයක් දුන්නා මෙන්ම අපේ විප්ලවීය ජීව ගුණය වැඩි කරන්නටත් සමත් විය. අති සාර්ථක ප්‍රචාරක ව්‍යාපාරය නිසා ජනාධිපතිවරණයේ ප්‍රතිඵල පිළිබඳ අපට පූර්ව නිගමනයක් තිබූ බව අවංකව පැවසිය යුතුය. අපේ බලාපොරොත්තුව වූයේ ජයග්‍රහණය නොව ප්‍රමාණවත් ඡන්ද සංඛ්‍යාවක් ලබාගැනීමයි. පක්ෂයට දිවයින පුරාම පූර්ණ කාලීන අර්ධකාලීන හා සාමාජිකයන් ලක්ෂ 4 කට ආසන්න ප්‍රමාණයක් විය. ඒ හරහා අපට සම්බන්ධ වූ පිරිසද මැතිවරණ ප්‍රචාරක වැඩ පිළිවෙල හරහා අපට ලැබුණ මහජන ප්‍රතිචාර නිසා අවම වශයෙන් ලක්ෂ 7 ක් අටක් පමණ ඡන්ද ප්‍රමාණයක් අපට ලබාගත හැකි වෙතැයි අපි සිතුවෙමු. ඒ සියල්ල උඩු යටිකුරු වූයේ මැතිවරණ ප්‍රතිඵල නිකුත් වූ පසුවය. සත්‍ය ලෙසම ඒ ප්‍රතිඵලය අපට දරා ගත නොහැකි එකක් විය. මුලු දිවයිනෙන්ම රෝහණ සහෝදරයාට ලැබුණේ 273000 කට ආසන්න ඡන්ද සංඛ්‍යාවකි. විය යුතු ලෙසම ජේආර් ජයගත්තේය. අපට හිත හදා ගත හැකි වූයේ වාමාංශික පක්ෂ අතරින් අප ඉදිරියෙන්ම සිටීම පමණකි. ඛේදවාචකය වූයේ ඊට මාස කීපයකට පෙර පැවැති සංවර්ධන සභා ඡන්දයේදී ලබාගත් ඡන්ද සංඛ්‍යාවද මීට වඩා වැඩි වීමයි.

මගේ විප්ලවවාදී ජීවිතයේ පළමු දෙදරීම එසේ සිදුවිය. මැතිවරණයෙන් පසුව මම ගෙදර ගියෙමි. ඒ මා ගෙදරින් පිට වී මාස දෙකහමාරකට පසුවය.

**මතු සම්බන්ධයි**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com